INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT


W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA


**2021 අගෝස්තු 13**

**මාධ්‍ය නිවේදනය: බ්‍රිතාන්‍ය පසු විපරමින් කළ යුත්තේ ශ්‍රී ලංකා පොලිසියට දෙන පුහුණුව අවලංගු කිරීමයි**

**ලන්ඩන්:** ස්කොට්ලන්තය විසින් පුහුණු කරනු ලබන ශ්‍රී ලංකාවේ පොලිස් ඒකකවල මානව හිමිකම් වාර්තාවේ ගැටළු හේතුවෙන් එකී පුහුණුව 2021 මැයි මාසයේ මුල සිට පුනරීක්ෂණයට යොමු කර ඇති බවට පලවන වාර්තා[1] මානව හිමිකම් සංවිධානවලත්, මාධ්‍යවේදීන්ගේත් ප්‍රසාදයට හේතු වී තිබේ. මෙම පසු විපරම සිදුවන්නේ ප්‍රශ්න කිරීමේ විධික්‍රමයක් ලෙස වධබන්ධන යොදාගැනීම පිළිබඳව චෝදනා ලබන පොලිස් ඒකක පුහුණු කිරීම ගැන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දිගින් දිගටම ප්‍රශ්න කිරීමෙන් අනතුරුවය.

වධහිංසා කිරීමේ භාවිතාවේ ගිලී ඉන්නා ශ්‍රී ලංකා පොලිස් ඒකකවලට බ්‍රිතාන්‍ය පුහුණුව ලබාදීම පුනරීක්ෂණයට ලක් කරන ලෙස සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) ඉල්ලා තිබෙන්නේ 2016 සිටය. වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවට (UNCAT) ඒ අවුරුද්දේ පැමිණි නියෝජිත පිරිසට ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසානයේ පවත්වාගෙන යනු ලැබූ දරුණුතම වධකාගාරයක් භාරව සිටි පොලිස් නිලධාරියා ලෙස එක්සත් ජාතීන්ගේ විමර්ශනයක[2] නම් කර තිබූ අයකු ඇතුලත් කර තිබුනේ කිසිදු විලිබියකින් තොරවය.

*"තම ත්‍රස්ත මර්දන පොලිස් ඒකකය පුහුණු කිරීම බ්‍රිතාන්‍යය විසින් සිදු කෙරෙන බව හුවා දක්වමින් සිය වාර්තාවට සුදුහුණු ගාන්නට ශ්‍රී ලංකාවේ නියෝජිත පිරිස ජිනීවාහිදී වීරිය දැරීය,"* යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. "චෝදනා ලබන අපරාධකරුවන් වගඋත්තරදායකත්වයෙන් බැඳ තැබීමට ශ්‍රී ලංකාව බරපතල ලෙස පියවර ගන්නා තාක් කල් එම වැඩසටහන අවලංගු කරන ලෙස අපි බ්‍රිතාන්‍ය රජයෙන් ඉල්ලා සිටින්නෙමු."

ත්‍රස්ත මර්දන පොලිසිය (TID[3]) විසින් සංස්ථාපිතව වධහිංසා පැමිණවීම පිළිබඳ සාක්ෂි සහ ඒ පිළිබඳ චෝදනාවට ලක්වන අපරාධකරුවන් ගණනාවකගේ නම්[4] ද ITJP විසින් එක්රැස් කර තිබේ. ඊට අමතරව, යුද සමයේ පැහැරගැනීම්, වධහිංසා, සහ දෙමළ පුද්ගලයන් මරා දැමීමට සම්බන්ධ වීම ගැන පොලිස් විශේෂ කාර්ය සාධක බලකායේ (STF) සාමාජිකයන් විසින් දෙන ලද ප්‍රකාශනද එම සංවිධානය විසින් ලේඛනගත කර තිබේ[5].

[1] https://www.thetimes.co.uk/article/police-training-in-sri-lanka-halted-over-abuse-fears-3w87qk9rp
https://www.heraldscotland.com/politics/19507167.police-scotland-training-sri-lankan-forces-accused-executions-torture/
[2] A/HRC/30.CRP.2
[3] Now renamed CTID (ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය).
[4] https://itjpsl.com/reports/terrorism-investgation-division
[5] https://itjpsl.com/reports/special-task-force

**බ්‍රිතාන්‍ය භූමිකාව විභාග කිරීම**

බ්‍රිතාන්‍යය විසින් ශ්‍රී ලංකාවේ පොලිස් විශේෂ කාර්ය සාධක බලකායට පුහුණු කිරීම පිළිබඳ ඉතිහාසය මුලින්ම වාර්තා කරනු ලැබුවේ ඝාතන සිදු කළ බවට චෝදනා ලබන[6] එම බලකායට පුහුණුව ලබා දීම හා සම්බන්ධ රහසිගත බ්‍රිතාන්‍ය කුලී හේවා කණ්ඩායමක් පිළිබඳව ගවේෂණයේ යෙදුනු ෆිල් මිලර් ජනමාධ්‍යවේදියා විසිනි.

*" 2007 සිට දිගටම වාගේ ශ්‍රී ලංකාවේ නිලධාරීන් පුහුණු කිරීමේ යෙදී සිටි ස්කොට්ලන්ත පොලිසිය එම ව්‍යාපෘතිය නවත්වන්නට දැන් තීරණය කිරීම කුතුහලය දනවන්නක් වන අතර, එය මුළුමනින්ම අහෝසි කර දමනු ඇතිදැයි දැනගන්නට ක්‍රමයක් නැතැ,"* යි ෆිල් මිලර් පැවසීය.

*"මේ වැඩසටහන ගැන ප්‍රශ්න මතුකළ මගේ වසර ගණනාවක ගවේෂණ ස්කොට්ලන්ත පොලිසිය විසින් නොතකා හරින ලද මුත්, සමහරවිට හිට්ලර් ගරු කොට සලකන්නකු මැයි මාසයේදී ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍ය ධුරයට පත් කිරීම බ්‍රිතාන්‍යයට දිරවා ගන්නට බැරි වන්නට ඇතැ,"* යි ඔහු වැඩි දුරටත් පැවසීය.

මෑත භාගයේ ශ්‍රී ලංකාවේ පොලිස් කුරිරුකම් ගැන වාර්තාකොට ඇති ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) *"බොහෝ කලකට පෙර සිදුවිය යුතුව තිබූ පුහුණුව අත්හිටුවීම"* සම්බන්ධයෙන් ප්‍රසාදය පලකළත්, මැයි මාසයේ ගන්නා ලද තීන්දුව *"ශ්‍රී ලංකාවේ පොලිසියේ සැහැසිකම් වෙනස් කොට නැතැ,"* යි කියා සිටී.

*"පැහැරගැනීම්, හිතුමතේ අත් අඩංගුවට ගැනීම්, වධබන්ධන සහ ඝාතන පිළිබඳව මැයි මාසයෙන් පසුවත් නොකඩවා වාර්තා වී තිබේ. මෙයින් විදහා දැක්වෙන්නේ හමුදාව වේවා, පොලිසිය වේවා ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන අපරාධවල සංස්ථාපිත ස්වරූපයයි."*

ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට දෙනු ලබන පුහුණුව සහ පොලිස් විශේෂ කාර්ය බලකායට ස්කොට්ලන්ත පොලිසිය පුහුණුව දෙන්නේද යන්න පිළිබඳව ෆිල් මිලර්ගේ වාර්තා චිත්‍රපටිය *කීනි මීනි: බ්‍රිතාන්‍යයේ පුද්ගලික හමුදාව* එළි දැක්වීමෙන් අනතුරුව 2021 පෙබරවාරියේ ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවේ ප්‍රශ්න මාලාවක් අසන ලදී.[7] වංක බව කැපී පෙනෙන ආණ්ඩුවේ ප්‍රතිචාරය වූයේ ස්කොට්ලන්ත පොලිසිය පොලිස් විශේෂ කාර්ය සාධක බලකායට විශේෂයෙන් පුහුණුවක් ලබා නුදුන් බවයි.

නිශ්චිත පොලිස් ඒකක වල සාමාජිකයන් කී දෙනකුට පුහුණුව ලබා දුන්නේදැයි තහවුරු කරගැනීමට තොරතුරු දැනගැනීමේ නිදහස යටතේ ITJP විසින් 2018 ජූලි හා ඔක්තෝබර් මාස වලදී කරන ලද විමසීම් වලටද බ්‍රිතාන්‍යයේ විදේශ හා පොදුරාජ්‍ය මණ්ඩලීය කටයුතු අමාත්‍යාංශයෙන් (FCO) ලැබුනේ ඒ හා සමාන වංක ප්‍රතිචාරයකි. සහභාගි වූවන්ගේ සංඛ්‍යාව හෙළි නොකළ[8] FCO අමාත්‍යාංශය හුදෙක් කියා සිටියේ *"මේ ඇතැම් පුහුණු සැසිවාර සඳහා TID/CID නිලධාරීන් සහභාගී නොවූයේ යැයි කිව නොහැකි,"*[9] බවයි. සෝදිසි කිරීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ නිලධාරීන් කී දෙනකු ඉවත් කරන ලද්දේදැයි කරන ලද විමසීමට ඔවුන්ගේ පිළිතුර වූයේ "කිසිදු අපේක්ෂකයකුට පුහුණුව දීම ප්‍රතික්ෂේප කළ බවක් ගැන අපේ දැනුවත් කමක් නැත," යන්නයි.

ගැටළු සහගත පොලිස් ඒකකවල පුද්ගලයන් නම් කොට ඔවුන්ට ස්කොට්ලන්ත පුහුණුව දීම ගැන විමසන ලද කල්හි, පුද්ගලික දත්ත යැයි පවසමින් ඒ තොරතුරු ලබාදීම විදේශ හා පොදුරාජ්‍ය මණ්ඩලීය කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේප කරන ලදී[10]. පුහුණුව ලද්දවුන් පිළිබඳ මානව හිමිකම් තක්සේරුවේ පිටපත්ද තොරතුරු දැනගැනීමේ නිදහස යටතේ ඉල්ලා සිටිනු ලැබුවත්, ද්විපාර්ශවීය සබඳතා පලුදු වෙතැ'යි පවසමින් ඒවා ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී[11].

**මානව හිමිකම් තක්සේරුව**

ශ්‍රී ලංකාවේ පොලිසියට පුහුණුව ලබා දීමේදී සිදුකරන මානව හිමිකම් තක්සේරුවේ පාරදෘශ්‍ය භාවයක් නැතිකම පිළිබඳව Redress සංවිධානය හා එක්ව ITJP විසින් 2019 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කරන ලද ලියවිල්ලක් මගින් ප්‍රශ්න මතු කරන ලදී[12]. එහි මෙසේ සඳහන් වෙයි. *"වධහිංසා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු බවට චෝදනා ලබන ඒකක තුනක් භාරව සිටි ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් අඩුම වශයෙන් තුන් දෙනකුවත් බ්‍රිතාන්‍යය විසින් මීට ඉහතදී පුහුණු කරන ලද බව වාර්තා වේ."*

---

[6] https://www.plutobooks.com/blog/keenie-meenie-britains-private-army/
[7] https://www.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-32593&ResultsPerPage=10
[8] This was before the name change.
[9] FOI request reference 0797-18.
[10] Reference 1004-18.
[11] Ref 1063-18.
[12] https://redress.org/wp-content/uploads/2019/05/UK-Implementation-of-UNCAT_REDRESS_March2019_Web.pdf

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවට පුහුණුව ලබා දීම සඳහා 2012 සිට බ්‍රිතාන්‍ය පොලිස් නිලධාරීන් හෝ පොලිස් කාර්ය මණ්ඩල සාමාජිකයන් හෝ යවන ලද වාර ගණන 90 කි[13]. පුහුණුව ලබන නිලධාරීන්ගේ සුපරීක්ෂණය ක්‍රමවේදය සහ පොලිසිය විසින් කරනු ලබන මානව හිමිකම් උල්ලංඝන පිළිබඳව ස්කොට්ලන්ත මන්ත්‍රීවරුන් විසින් 2021 දී ප්‍රශ්න කරන ලදී[14]. ඒ අවස්ථාවේ ස්කොට්ලන්ත ආණ්ඩුව පැවසුවේ වසංගතය නිසා පුහුණු කටයුතු තාවකාලිකව නතර කර ඇති අතර සංචරණ සීමා ඉවත් කළ විට එය නැවත තක්සේරු කෙරෙනු ඇති බවයි[15]. 2019 සිට සිදුකරන ලද පුහුණු කිරීම් යොමු කෙරුනේ "ලිංගික හා ලිංගික සමාජභාවී ප්‍රචණ්ඩතා වැලැක්වීම සහ සහ විමර්ශනය[16]" වෙනුවෙන් බව ආණ්ඩුව විසින් සහතික කරන ලදී.

*"ශ්‍රී ලංකාවේ පොලිසිය විසින් දිගටම සිදුකරනු ලබන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ වාර්තා ගැන ඇසෙන කල මෙය බරපතල ප්‍රශ්නයකි,"* යි යැස්මින් සූකා පැවසුවාය. *"ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයේ සාමාජිකයන් විසින් 2020 දී තරුණ දෙමළ පිරිමි ලිංගික වශයෙන් දූෂණය කිරීම සම්බන්ධ වාර්තා අපි මේ වනවිට ලේඛන ගත කරමින් සිටින්නෙමු."*

**ආධාර මුදල්**

ගැටුම්, ස්ථාවරභාවය සහ ආරක්ෂාව සඳහා වන අරමුදල විසින් පොලිස් පුහුණුවද ඇතුළුව, ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන වැඩ සටහන් සඳහා දිගටම අරමුදල් සැපයීමේ සැලසුම් ගැනත්[17], වැය නොකරන ලද මුදලක් වේ නම් එය නැවත යොදවනු ලබන්නේ කෙසේද[18] යන්නත් ලිබරල් ඩිමොක්‍රටික් පක්ෂයේ නායක එඩ් ඩේවි විසින් 2021 මැයි මාසයේදී බ්‍රිතාන්‍යයේ විදේශ, පොදුරාජ්‍ය මණ්ඩල හා සංවර්ධන අමාත්‍යාංශයෙන් විමසන ලදී.

"ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය සඳහා ආණ්ඩුව විසින් වැය කර ඇති පවුම් මිලියන 6.3 විසින් මානව හිමිකම් ක්ෂේත්‍රයේ ඇතිකර තිබෙන බලපෑම සම්බන්ධයෙන් සොයාබලා එම තක්සේරුව ප්‍රසිද්ධියට පත් කරන්නේ දැ," [19] යි ලේබර් පක්ෂ මන්ත්‍රී සෑම් ටැරි ඉන් අනතුරුව 2021 ජූලි මාසයේදී විමසීය. පුහුණුවේ පලදායීතාව ගැන ස්වාධීන විගණනයක් පවත්වන ලෙස එවක ලේබර් නායක ජෙරමි කෝබින් 2017 දී ඉල්ලා සිටියත් එය කවදාවත් සිද්ධ වූයේ නැත[20].

*"දෙමළ ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශවලින් ඇති තරම් බැට කා තිබෙන අතර ලිංගික දූෂණය සහ වධහිංසාව වැරද්දක් බව ඔවුන්ට උගන්නන්නට අපේ බදු මුදල් නාස්ති නොකළ යුතුය,"* යි ලේබර් වෙනුවෙන් දෙමළ ජනතාව සංවිධානයේ සෙන් කන්දයියා පැවසීය.

*"එය අදත් මෙහි පැමිණෙමින් සිටින වින්දිතයන්ට කරන අවමානයකි."*

සමාප්තයි.

---

[13] https://archive2021.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-33122&ResultsPerPage=10
[14]https://archive2021.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-34885&ResultsPerPage=10
Neil Findlay MSP: 02/02/2021: To ask the Scottish Government whether it will provide details of the vetting procedures for Police Scotland's work with Sri Lanka, in light of the recent recommendation from the UN High Commissioner on Human Rights for all member states to "apply stringent vetting procedures to Sri Lankan police and military personnel identified for military exchanges and training programmes"
[15]https://archive2021.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-34895&ResultsPerPage=10
Andhttps://archive2021.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-33635&ResultsPerPage=10
[16] https://www.parliament.scot/parliamentarybusiness/28877.aspx?SearchType=Advance&ReferenceNumbers=S5W-32591&ResultsPerPage=10
[17] https://questions-statements.parliament.uk/written-questions/detail/2021-05-25/7092/
[18] https://questions-statements.parliament.uk/written-questions/detail/2021-05-25/7091/
[19] https://questions-statements.parliament.uk/written-questions/detail/2021-07-20/36806
[20] https://www.tamilguardian.com/content/'time-focus-accountability-sri-lanka'-—-jeremy-corbyn

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT